NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA COLOMBO 10

**ඒකක පරීක්ෂණය**

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 7 ඒකකය |
|---|---|---|

## සීලය හා භෞතික සංවර්ධනය

## I කොටස

**01. නිවැරදි පිළිතුර ලකුණු කරන්න.**

1. සීලය යනුවෙන් අදහස් කරන නිවැරදි පිළිතුර වනුයේ,
   - i. සිත, කය, වචනයෙහි සංවරයයි
   - ii. කයෙහි සංවරයයි
   - iii. කය, වචනයේ සංවරයයි
   - iv. ඉහත සඳහන් සියල්ලයි

2. නිවන් මඟෙහි පළමු පියවර වන්නේ,
   - i. සීලයයි
   - ii. ප්‍රඥාවයි
   - iii. සමාධියයි
   - iv. ත්‍රිශික්ෂාවයි

3. කයින් කරන අකුසල් සංඛ්‍යාත්මකව නිවැරදි වර්ණය වන්නේ,
   - i. 04 යි
   - ii. 06 යි
   - iii. 03 යි
   - iv. 05 යි

4. ගිහි පින්වතුන් ආරක්ෂා කරන සීලයක් නොවන්නේ,
   - i. ගේහසිබ සීලය
   - ii. අෂ්ටාංග සීලය
   - iii. උපෝසථ සීලය
   - iv. පංච සීලය

5. සිල්වත් වීමේදී ඇති කරගත යුතු සංවරය දෙයාකාරයකි. එය නිවැරදිව ඇති වර්ණය වනුයේ,
   - i. කය හා සිත
   - ii. කය හා වචනය
   - iii. වචනය හා සිත
   - iv. සිත හා කය

## II කොටස

- **සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

02. I. කයින් සිදුකරන අකුසල් තුන සඳහන් කරන්න.
    II. සීල ශික්ෂාවට අයත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග තුන නම් කරන්න.
    III. පංච සීලය හැඳින්වීමට වෙනත් නමක් ලියන්න.
    IV. සිල්වත් වීමේදී ඇති කරගත යුතු සංවරය දෙයාකාර වේ. නම් කරන්න.
    V. වචනයෙන් කෙරෙන අකුසල් සතර නම් කරන්න.
    VI. ගිහියාට සමාදන් විය හැකි සිල් වර්ග හතරක් සඳහන් කරන්න.
    VII. දේව ධර්ම සඳහන් කරන්න.
    VIII. සීලයට අයත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග තුන නම් කරන්න.
    IX. ත්‍රිකෝටික පාරිශුද්ධ සීලය සඳහන් කරන්න.
    X. විරති හා සමාදන යන්නෙහි අදහස ලියන්න.

03. සීලය ආරක්ෂා කිරීමෙන් සිදුවන ජීවිත ආරක්ෂාව, දේපල ආරක්ෂාව හා සමාජ සදාචාරය ආරක්ෂාවීම පිළිබඳ පැහැදිලි කරන්න.